බුදුසරණ
Buddhist Era 2546 Medin Second Quarter - Tuesday, March 25, 2003



තොරොන්ටෝ විහාරයේ බුද්ධ පූජාව

## ※ දියුණුවේ රන් දොරටු

– උඩුපිහිල්ලේ විමලබුද්ධි හිමි

පුද්ගලයාගේ ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට බලපාන බුදු ඔවදනකට අර්ථකථනයක්; මැදින් අව අටවක පෝද ධර්ම දේශනාවෙන්. විශේෂයෙන්ම අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට ඉතා වැදගත් ධර්මෝපදේශයක් ලෙස, මෙම බුද්ධ දේශනා පාඨය හැඳින්විය හැකිය.

## ※ සමාජ අසහනයට මුල් වූ බ්‍රාහ්මණ චාරිත්‍ර ධර්ම

– ඌරුගමුවේ අස්සජි හිමි

ප්‍රාග් බෞද්ධ යුගයේ භාරත සමාජය තුළ පැවැති ආගමික පසුබිම පිළිබඳ ලිපියකි. බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ පැවති විවිධ චාරිත්‍ර – වාරිත්‍ර නිසා එද භාරතයේ විවිධ සමාජ කොටස් තුළ පැන නැගී තිබුණු අසහනකාරී වාතාවරණය පිළිබඳ විමසුමකි.

## ※ නිව්යෝර්ක් නගර සභාවෙන් කුරුණෑගොඩ නාහිමිට උපහාර

'සයුරෙන් එහා' බෞද්ධ ප්‍රවෘත්ති විශේෂාංගය යටතේ පළ වූ ඇමෙරිකාවේ නිව්යෝක් නුවර සහ කැනඩාවේ ටොරොන්ටෝ මහා විහාරයේ පැවැත්වුණු බොදු උත්සව දෙකක් පිළිබඳ ඡායාරූප සහිත ප්‍රවෘත්ති දෙකකි.

## ※ මග – පල ලැබීම සිහිනයක් නොවේ – 17

– දෙලොස්වල උදිතධීර හිමි

බොදු පිළිවෙතෙහි දැක්වෙන ඉහළ මානසික තත්ත්ව ලබා ගැනීම – බොහෝ දෙනා සිතන පරිදි බොහෝ අසීරු කටයුත්තක් නොවන බව ද උනන්දුව ඇති අයට ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම දහම තුළ නිරවුල් ලෙස දක්නට ලැබෙන බව ද පැහැදිලි කිරීමට උත්සාහ දරන ලිපි පෙළක දහහත් වැනි ලිපිය.

## ※ බුදුසිරිත නිරූපිත භාරත මූර්ති හා කැටයම්

– සිරිසමන් විජේතුංග

'බෞද්ධ කලා නිර්මාණ' විශේෂාංගය යටතේ බුද්ධ චරිතය නිරූපණය කෙරෙන භාරුත්, බුද්ධගයා, සාංචි, ගන්ධාර, මථුරා හා අමරාවතී ආදී බෞද්ධ මධ්‍යස්ථානවල නිරූපිත බෞද්ධ කැටයම් පිළිබඳ ලිපියකි.

## ※ පෞරුෂ වර්ධනයට බුදු දහමෙන් පාඩම්

– දයා රෝහණ අතුකෝරළ

පෞරුෂ වර්ධනය පිළිබඳ නූතන මනෝ විද්‍යා විෂය තුළ සංවාදයට ලක්වන අදහස් හා බෞද්ධ මනෝ විද්‍යාවේ දැක්වෙන කරුණු අතර තුලනාත්මක විග්‍රහයක් ඇතුළත් ලිපියකි.

## ※ විශ්වය පුරා පැතිර යා යුතු සාර ධර්ම

– කැකිල්ලපිටියේ නාගිත හිමි

සමාජයක චිර පැවැත්මට හේතුවන සාරධර්ම ඒ තුළ ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව, සමාජ ප්‍රගතිය ඇති කිරීමෙහිලා බෞද්ධ දර්ශනය අනුව ගොඩ නැගෙන බෞද්ධ පිළිවෙත තුළ දක්නට ලැබෙන සාරධර්මවල උපයෝගීතාව.

## ※ නිවන් සුවයට රුවන් මාවත

– නිදන්වල සීලාධාර හිමි

මනුෂ්‍යයාට අවසන් විමුක්තියක් සැලසෙන එකම මග වූ චිත්ත දමනයෙහි වැදගත්කම. ජීවිත සාර්ථකත්වය – පරලොව සැපත හා මෝක්ෂ සුවය සලසන බෞද්ධ පිළිවෙතෙහි සිත දමනයට හිමිවන ප්‍රමුඛතාව.

## ※ Qualities leading to success and decline

*-by Ven. Katumuluwe Sumanajothi*